# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 33 දරන ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජුනි මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජුනි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 7.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2009 අංක 33 දරන ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූනි මස 12 වන දින]

එල්.ඩී.—ඕ. 75/2006.

**ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පිහිටුවීම සහ එයට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 33 දරන ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "ආයතනය"යනුවෙන් හඳුන්වනු ලබන), ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය නමින් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පිහිටුවීම.

(2) ආයතනය (1) වන උපවගන්තියෙන් එයට දී ඇති නාමය යටතේ සංස්ථාවක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— ආයතනයේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ භූ දර්ශන නිර්මාණ ශිල්පී වෘත්තීය ජාත්‍යන්තරව පිළිගත් මට්ටමට ප්‍රවර්ධනය කිරීම;

(ආ) තිරසාර සංවර්ධන ක්‍රියාවලියේදීත්, පරිසරය සුරැකීම හා ප්‍රවර්ධනය කිරීම, ස්වාභාවික පද්ධතීන් එක් කිරීම සහ සමාජ සේවාවේ දී අදාළ කලාවන් හා විද්‍යාවන් භාවිත කිරීම යන කටයුතුවලදීත්, ස්වකීය වැදගත් භූමිකාව ඉටුකිරීම වෘත්තීයට පහසු කරලීම.

4. ආයතනයේ කර්තව්‍යයන් වනුයේ — ආයතනයේ කර්තව්‍යයන්.

(අ) භූ දර්ශන නිර්මාණ ශිල්පය හා ඒ හා සම්බන්ධ විෂයයන් හා ඒ හා සම්බන්ධ වූ කලාවන් හා විද්‍යාවන් අධ්‍යයනය, පුහුණුව, අදාළ කිරීම හා පර්යේෂණ කිරීම ද ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම ;

(ආ) අධ්‍යාපන හා වෘත්තීය යන ද්විත්ව ක්ෂේත්‍රයන් හී දී, දැනුම, නිපුණත්වය හා පළපුරුද්ද ජාත්‍යන්තරව හුවමාරු කරගැනීම ඇතුළුව, සර්ව භෞමිකව වෘත්තීය හා සමීප සබඳතා ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඇ) අනෙකුත් අදාළ වෘත්තිකයන් හා වෘත්තීය පුද්ගල මණ්ඩලයන් හා එකතුව භූ දර්ශන සැලසුම් කිරීම, සකස් කිරීම, වර්ධනය කිරීම, කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම පිළිබඳ වෘත්තීය ව්‍යවහාරයේ පවතින ඉහළම ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම;

(ඈ) භූ දර්ශන නිර්මාණ ශිල්පීන් ලෙස සුදුසුකම් ලබා ගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු කිරීම සඳහා පිළියෙල කිරීම, හසුරුවීම, ඇතුළත් කිරීම, පාලනය කිරීම, වෘත්තීය පහසුකම් සැලසීම, ආයතනයේ සාමාජිකත්ව ලබාගැනීම සඳහා වූ පාඨමාලා පැවැත්වීම සහ පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම කළ යුතු ය ;

(ඉ) ශ්‍රී ලංකාවේ සිටින භූ දර්ශන නිර්මාණ ශිල්පීන්ගේ වෘත්තීය සම්බන්ධතා, තත්ත්වය, ශුභසිද්ධීන්, අයිතීන් හා වරප්‍රසාද ද, එකී වෘත්තීයට අදාළ ව මහජනතාවගේ සම්බන්ධතා ද, භූ දර්ශන නිර්මාණ ශිල්පීන් ලෙස සුදුසුකම් ලබා ගැනීමේ අභිලාෂයෙන් යුත් තැනැත්තන්ගේ සම්බන්ධතා ද ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඊ) සාමාජිකයන්ගේ, නිලධරයන්ගේ හා සේවානියුක්තයන්ගේ ද සේවානියුක්තයන්ගේ යැපෙන්නන්ගේ ද සුභසාධනය සඳහා පුස්තකාල සහ සුභසාධක යෝජනාක්‍රම පිහිටුවීම, විධිමත් කිරීම සහ පවත්වාගෙන යාම.

ආයතනයේ පොදු බලතල.

5. මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත්ව ආයතනයට පහත සඳහන් බලතල ඇත:—

(අ) ආයතනයේ යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකට නීයාදනය කිරීම ;

(ආ) ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ ආයතනයේ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි අන්දමේ සියලු ගිවිසුම් හා එකඟතාවලට, සෘජුව හෝ මේ සඳහා ආයතනය විසින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇතුළු වීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම ;

(ඇ) සාමාජිකත්වය, සාමාජිකත්වය ලබාගැනීම සහ ආයතනය මගින් පවත්වන පාඨමාලා හා විභාග සම්බන්ධයෙන් ගාස්තු, සාමාජික ගාස්තු සහ සම්මාදම් ගෙවීම ;

(ඈ) ආයතනයේ සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක හෝ බැංකුවල අරමුදල් ආයෝජනය කිරීම හා ජංගම ගිණුම්, තැන්පතු හා ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඉ) ආයතනය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට හා ඇප මත ආයතනයේ කාර්යය සඳහා මුදල් අත්තිකාරම් දීම, ණයට දීම හා ණයට ගැනීම ;

(ඊ) ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් නියම කිරීම, ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය පැවැත්මේ මට්ටම් හා ඒවායේ පැවැත්ම සුරක්ෂිත කිරීම ;

(උ) නිලධරයන් හා සේවානියුක්තයන් පත්කිරීම, යෙදවීම, මාරු කිරීම, පහකිරීම, සේවයෙන් පහකිරීම සහ වෙනත් විනය පිළිබඳ කටයුතු කිරීම, ඔවුන්ගේ සේවක නියම හා කොන්දේසි නියම කිරීම ; සහ

(ඌ) ආයතනයේ පරමාර්ථයන් සිදු කිරීම සහ මුදුන්පත් කරගැනීම සාක්ෂාත් කරගැනීම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන්නා වූ ක්‍රියා සහ දේ සිදු කිරීම.

6. (1) මේ පනතේ 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පනත යටතේ සාදන ලද රීති මගින්, එක් එක් වර්ගයක සාමාජික පංතියක් සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චිතව සඳහන් කළ යුතු ය. ආයතනයේ සාමාජිකත්වය.

(2) පහත සඳහන් පංතිවලට අයත් සාමාජිකත්ව, ආයතනයේ තිබිය යුතු ය:—

(අ) අධි සාමාජිකයන් ;

(ආ) සාමාජිකයන් ; සහ

(ඇ) මෙම පනත යටතේ සාදන රීති මඟින් නිශ්චිතව සඳහන් කරනු ලබන විවිධ පංතිවලට අයත්, සමායිත සාමාජිකයකු නොවන සාමාජිකයකු.

(3) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදයන්හි සඳහන් සාමාජික පංතීන් සමායිත සාමාජිකයන් ලෙස හඳුන්වනු ලැබේ.

(4) සෑම සමායිත සාමාජිකයකු ම ආයතනයේ මණ්ඩලයට හෝ යම් කමිටුවකට තේරී පත්වීමට සුදුස්සකු වන අතර, සියලුම අයිතීන් හා වරප්‍රසාදවලට හිමිකම ඇත්තකු වන්නේ ය.

(5) සෑම සමායිත නොවන සාමාජිකයකුට ම ආයතනයේ කමිටුවල රැස්වීම්වලට සහභාගීවීමට අයිතියක් ඇති නමුදු ඡන්දය දීමේ අයිතිය නොමැත්තේ ය.

ආයතනයේ සාමාජිකත්වය සඳහා ගාස්තු.

7. (1) 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආයතනයේ සාමාජිකත්වයට සුදුසු තැනැත්තකු, මේ පනත යටතේ සාදන ලද රීතිවල නිශ්චිතව සඳහන් විය හැකි පරිදි වූ ගාස්තුවක් ආයතනයට ගෙවීමෙන් ආයතනයේ සාමාජිකයකු ලෙස ලියාපදිංචි විය යුතු ය.

(2) ආයතනයේ සාමාජිකයකු ලෙස තැනැත්තකු ලියාපදිංචි වීම, ලියාපදිංචි වූ වර්ෂයේ දෙසැම්බර් 31 වන දින තෙක් බලාත්මක විය යුතු අතර, රීතිවල නිශ්චිතව සඳහන් ගාස්තුව ගෙවීමෙන් එම ලියාපදිංචි වීම වාර්ෂිකව නැවත අලුත් කළ හැකි ය.

පදවිනාමයන් භාවිතාව.

8. (1) ආයතනයේ යම් සමායිත සාමාජිකයකු ම, "වරලත් භූ නිර්මාණ ශිල්පී" යන පදවි නාමය ගෙන, භාවිත කිරීමට සුදුස්සකු වන අතර, ඔහු ආයතනයේ අධිසාමාජිකයකු බව දැන්වීම සඳහා තම නාමයට පසු, එෆ්.අයි.එල්. ඒ. (ශ්‍රී ලංකා) කෙටි යෙදුම යෙදීමට ද, ඔහු ආයතනයේ සාමාජිකයකු බව දැන්වීම සඳහා තම නාමයට පසු, එම්.අයි.එල්.ඒ. (ශ්‍රී ලංකා) යන කෙටි යෙදුම භාවිත කිරීමට ද ඔහුට අයිතිය ඇත්තේ ය.

(2) සෑම හවුල්කරුවකු ම ආයතනයේ සහයෝගිතා සාමාජිකයකු වන්නා වූ යම් භූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනයක්ම "වරලත් භූ දර්ශන නිර්මාණ ශිල්පීන්"යන පදවි නාමය ගෙන, භාවිත කිරීමට අයිතිය ඇත්තේ ය.

(3) යම් හවුල් ව්‍යාපාරයක එක් හවුල්කරුවකු හෝ හවුල්කරුවන් එකකට වැඩි සංඛ්‍යාවක් සමායිත සාමාජිකයන් වන විට, ඉතිරි හවුල්කරුවන් වෙනත් වෘත්තීන්හි සාමාජිකයන් වන්නේ නම්, එම හවුල් ව්‍යාපාරයට අවස්ථාවෝචිත පරිදි "වරලත් භූ දර්ශන නිර්මාණ ශිල්පියා" හෝ "වරලත් භූ දර්ශන නිර්මාණ ශිල්පීන්" යන පදවි නාමය එම හවුල් ව්‍යාපාරයේ විස්තරයේ කොටසක් ලෙස භාවිත කිරීමට සභාව විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(4) ඉහත සඳහන් පරිදි හැර කිසිම පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් "වරලත් භූ දර්ශන නිර්මාණ ශිල්පී" හෝ "වරලත් භූ දර්ශන නිර්මාණ ශිල්පීන්" යන පදවි නාමය ගැනීම හෝ භාවිත කිරීම හෝ එෆ්.අයි.එල්.ඒ. (ශ්‍රී ලංකා) හෝ එම්.අයි.එල්.ඒ. (ශ්‍රී ලංකා) යන මුල'කුරු භාවිත කිරීම හෝ එකී මුල'කුරු ස්වකීය නාමය වශයෙන් හෝ නාමයේ කොටසක් වශයෙන්, භූ දර්ශන නිර්මාණ ශිල්පය හෝ භූ දර්ශන නිර්මාණ ශිල්පීය පරිධයන් හෝ භූ දර්ශන නිර්මාණ ශිල්පී වෘත්තීය හෝ පිළිබඳ වූ යම් ග්‍රන්ථයක, වාර සඟරාවක නැතහොත් වෙනත් ප්‍රකාශනයක භාවිත කිරීම නොකළ යුතු ය.

(5) යම් තැනැත්තකු සමායිත සාමාජික පංතියේ යම් ශ්‍රේණියක සාමාජිකයකු වශයෙන් තත්කාලයේ ශ්‍රේණිගතව ඇත්තේ නම් මිස, එවැනි ශ්‍රේණියක ශ්‍රේණිගත වූ සාමාජිකයකු විසින් පමණක් ගැනීම හෝ භාවිත කිරීම කළහැකි වූ මෙහි ඉහත (1) වන උපවගන්තියේ සඳහන් කොට ඇති ධුර හෝ කෙටි පදවි නාම කවර හෝ සාමාජිකයකු විසින් ගැනීම හෝ භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

9. (1) ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය සඳහා (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සභාවක් ආයතනයට තිබිය යුතු ය. මණ්ඩලයේ සංයුතිය.

(2) සභාව, සභාපති, උපසභාපති, අනුයාත මණ්ඩලයක් වූ විට ආසන්නතම හිටපු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, සහකාර ලේකම්, සහකාර භාණ්ඩාගාරික සහ ආයතනයේ රීති අනුව තෝරා පත්කරන ලද්දා වූ නැතහොත් පත්කරන ලද්දා වූ ද සාමාජිකයන් දෙදෙනකුට නොඅඩු හා අටදෙනකුට නොවැඩි වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. ආයතනය විසින් එකී සමායිත නොවන සාමාජිකයන් නියෝජනය කිරීම සඳහා ආයතනයේ සමායිත නොවන සාමාජිකයන් අතරින් දෙදෙනකුට නොවැඩි වූ තැනැත්තන් සංඛ්‍යාවක් තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට සලස්වනු ලැබිය හැකි ය. එසේ වුව ද, ආයතනයේ රීති යටතේ මණ්ඩලයේ සාමාජිකත්වය සහ සමායිත සාමාජිකත්වය සඳහා අවශ්‍ය නියමයන් සපුරාලන පුද්ගලයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇතිවන තෙක් වූ කාලයක් ආයතනය පවතින තෙක්—

(i) යම් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක භූ දර්ශන නිර්මාණ ශිල්පය හෝ භූ දර්ශන මෝස්තර නිර්මාණය පිළිබඳ පූර්ණ කාලීන සංක්ෂිප්ත පශ්චාත් උපාධි පාඨමාලාවක් ; සහ

(ii) ඉන්පසු යටත් පිරිසෙයින් අවුරුදු හයක කාලයක් භූ දර්ශන නිර්මාණ ශිල්ප වෘත්තියේ යෙදීම හෝ එකී ශිල්පය ඉගැන්වීම,

සම්පූර්ණ කළ සාමාජිකයන් සභාවේ සභාපති හා වෙනත් සාමාජිකයන් විය යුතු ය.

(3) මරණින්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරයෙන් ඉවත් වුවහොත් හැර ආයතනයේ රීතිවල නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය සඳහා සෑම සාමාජිකයකු ම ධුර දැරිය යුතු ය.

(4) සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ආයතනයේ සාමාජිකයකු වීම අවසන් වුවහොත් මණ්ඩලයේ ධුරයෙන් ඉවත් විය යුතු ය.

(5) සභාවේ සාමාජිකයකු මියගිය විට හෝ ධුරයෙන් ඉවත් වූ විට, එකී සාමාජිකයාගේ ස්ථානයට වෙනත් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු අතර, ඒ තැනැත්තා ධුරය හිස්කළ සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුත්තේ ය.

(6) සභාවේ යම් සාමාජිකයකු කාලය ඉකුත්වීම හේතුකොට ගෙන තම ධුරය හිස් කරන අවස්ථාවක දී ඔහු නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

පුරප්පාඩුවක් හේතුවෙන් ක්‍රියාවක් අවලංගු නොවන බව.

**10.** සභාවේ පුරප්පාඩුවක් තිබීම හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත්කිරීමෙහි ලා හෝ තෝරා පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම කරණකොට ගෙනම පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වන ලෙස නොසැලකිය යුත්තේ ය.

සභාවේ රැස්වීම.

**11.** ආයතනයේ රීතිවල නිශ්චිතව සඳහන් පරිදි සභාවේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ පවත්වාගෙන යාම සිදු කළ යුතු ය.

**12.** (1) සභාව විසින්, මේ පනත මගින් අවශ්‍ය යයි නිශ්චිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් ඇති රීති සෑදීම සඳහා බලය දෙනු ලැබූ හෝ නිශ්චිත හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් රීති සෑදීම කරනු ලැබිය හැකි ය. එසේ සාදන ලද රීති එවැනිම රැස්වීමක දී එම ආකාරයෙන් ම වෙනස් කිරීම, එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය. රීති සෑදීමට බලතල.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි මණ්ඩලය විසින්, පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යමක් පිළිබඳව, මෙම පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) සාමාජිකයන් බඳවා ගැනීම, ලියාපදිංචි කිරීම සහ නෙරපීම, සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්, සාමාජිකත්ව සහතිකවල ආකෘතිය සහ ඒවා නිකුත් කිරීම, සාමාජිකයන්ගේ ලේඛනයක් පවත්වා ගෙන යාම, සාමාජික ගාස්තු අයකිරීම, අතහැර දැමීම හෝ අඩු කිරීම සහ සාමාජික ගාස්තු නොගෙවීමේ ප්‍රතිඵලය සහ සාමාජිකයන්ගේ අයිතීන්, වරප්‍රසාද හා යුතුකම්;

(ආ) සභාවේ ධුර කාලය, සභාවට තෝරා පත්වන ආකාරය හෝ පත්වන ආකාරය, ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත්වීම, තාවකාලික පුරප්පාඩු පිරවීම, සභාවේ බලතල පැවරීම හා කර්තව්‍ය, කමිටු පත්කිරීම, සභාවේ වාර්ෂික වාර්තාව, එහි පොදු මුද්‍රාව පිළිගැනීම හා භාවිතය;

(ඇ) සභාවේ නිලධරයන්ගේ අයිතිවාසිකම්, බලතල, කර්තව්‍ය හා කාර්යය;

(ඈ) සභාවේ රැස්වීම, ආයතනයේ සාමාජිකයන්ගේ වාර්ෂික සභා රැස්වීම, වෙනත් සභා රැස්වීම් සහ විශේෂ සභා රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම් පවත්වන වේලා සහ ස්ථාන දැන්වීම සහ ඒවායේ න්‍යාය පත්‍ර, ඒවායේ කටයුතු පවත්වාගෙන යාම සහ ගණපූරණය ;

(ඉ) ආයතනයේ දේපළ කළමනාකරණය සහ මුදල්වල භාරකාරත්වය;

(ඵ) වෘත්තීය චර්යා පද්ධතියක් පිළියෙල කිරීම;

(ළ) විනය කමිටු පත්කිරීම සහ ඒ සඳහා නීති උපකාර ලබාදීම, පැමිණිලි ඉදිරිපත් කළ යුතු ආකාරය, චෝදනා පත්‍ර පිළියෙල කිරීම, පිළිතුරු සඳහා පැහැදිලිකරදීම් සැපයීම, නොතීසි නිකුත් කිරීම, එයට අදාළවන්නා වූ සාක්ෂි දීම සඳහා යම් තැනැත්තකු කැඳවීම, නඩුවෙහි වාර්තා පවත්වාගෙන යාම, විනය කමිටුවේ වාර්තාවල ආකෘතිය සහ අඩංගු දේ යනාදිය ඇතුළත්ව විනය පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියා පටිපාටිය;

(ළු) ආයතනයේ කටයුතු සඳහා අවශ්‍යවන්නා වූ සේවා නියුක්තයන් සහ වෙනත් යම් නිලධාරීන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම;

(එ) එම නිලධාරීන් සහ සේවානියුක්තයන් සේවයෙන් නෙරපීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඒ) එම නිලධාරීන්ගේ හා සේවානියුක්තයන්ගේ වේතන, වැටුප් හා වෙනත් දීමනා නියම කිරීම;

(ඔ) එම නිලධාරීන්ගේ හා සේවා නියුක්තයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි තීරණය කිරීම ; සහ

(ඕ) එම නිලධාරීන් හා සේවානියුක්තයන්ගේ යහපත සඳහා යෝජනාක්‍රම පිහිටුවීම සහ නියාමනය කිරීම සහ එකී අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායකත්ව සැපයීම.

(3) මෙම පනත යටතේ සාදන ලද සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතු ය.

(4) තත්කාලයේ ආයතනයේ රීතීන්වලට ආයතනයේ සාමාජිකයන් යටත් වේ.

(5) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් අර්ථ නිරූපණය කිරීමේ දී හෝ එහි සපයා නොමැති යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් සභාව විසින් ගන්නා තීරණය අවසාන තීරණය වේ.

සභාවේ බලතල පැවරීම.

**13.** (1) ආයතනයේ කාර්ය මණ්ඩලයට අනෙකුත් නිලධරයන් හා සේවා නියුක්තයන් පත්කිරීම සම්බන්ධ බලතල සියල්ල හෝ ඉන් කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට පැවරිය හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ සභාපතිවරයාට පවරන ලද බලතල යටතේ සභාපතිවරයා විසින් පත්කරන ලද නිලධරයන් හා සාමාජිකයන්ගේ වේතන ඇතුළු සේවා කොන්දේසීන් සභාපතිවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය මඟින් තීරණය කළ යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම තීරණයට එරෙහිව ලිඛිත අභියාචනයක් සභාවට ඉදිරිපත් කළ හැකි අතර, එකී අභියාචනය පිළිබඳ සභාවේ තීරණය අවසාන තීරණය වේ.

(4) සභාපතිවරයා විසින් ආයතනයේ නිලධරයකු හෝ සේවානියුක්තයකු ඉවත් කිරීම, සභාව විසින් එම ඉවත් කිරීම අනුමත කරන්නේ නම් මිස, බලාත්මක නොවිය යුතු ය.

පොදු නුසුදුසුකම්.

**14.** (1) යම් තැනැත්තකු—

(අ) මානසික දුබලතාවයකින් පෙලෙන්නකු බවට නිසි අධිකරණයක් මඟින් විනිශ්චය කොට තිබේ නම්;

(ආ) වස්තු භංගත්වයට පත්වූවකු හෝ බංකොලොත් භාවයට පත්වූවකු බවට නිසි අධිකරණයක් මඟින් විනිශ්චය කරනු ලැබ, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොලොත් භාවය සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් වැළැක්විය නොහැකි වූ පාඩු හෝ අවාසනාව හෝ හේතුවෙන් බවට වූ සහතිකයක් එකී අධිකරණය විසින් ප්‍රදානය කරනු ලැබ නොමැත්තේ නම් ;

(ඇ) සිරභාරයට පත් කිරීම හෝ ඒ හා සමාන දඬුවමකින් දඬුවම් කරනු ලැබිය හැකි යම් සදාචාර විරෝධී භාවය සම්බන්ධ වරදක් කිරීම පිළිබඳව නිසි අධිකරණයක් මඟින් වැරදිකරු කරනු ලැබ, නිදහස ප්‍රදානය කොට නොමැති නම්,

එකී තැනැත්තා ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා ගැනීම නොකළ යුතු ය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නුසුදුසුකමකට යම් තැනැත්තකු පත්වන්නේ නම්, සභාව විසින් එම තැනැත්තා ආයතනයේ සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතු ය :

එසේ වුව ද, එම තැනැත්තා නැවත සාමාජිකත්වය ලබා දීමට සුදුස්සකු බවට සභාව සෑහීමට පත්වන්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස පසුව බඳවා ගැනීමට සභාවට බාධාවක් නොමැත්තේ ය.

ආයතනයේ අරමුදල.

**15.** (1) ආයතනයට තමාගේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට—

(අ) පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයක්;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්යයන් ඉටුකිරීමේ දී ආයතනය වෙත ලැබෙන සියලු මුදල්;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ප්‍රභවයන්ගෙන් ණය, ප්‍රදානයන් හා ත්‍යාග වශයෙන් ආයතනය ලබාගන්නා වූ සියලු මුදල්,

බැර විය යුතු ය.

(3) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ආයතනයේ අරමුදලට වැය බරක් වන්නේ ය.

ආයතනයේ මුදල් වර්ෂය.

**16.** ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

**17.** ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ වේ.

ආයතනයේ මුද්‍රාව.

**18.** සභාවේ යෝජනා සම්මතයක අධිකාරිය මත සහ එම කටයුත්ත සඳහා මණ්ඩලය අනුමත කරන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු හෝ ලේකම් හා තවත් සාමාජිකයකු හෝ ඉදිරිපිට දී හැර, ආයතනයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය

යුතු අතර, එම සාමාජිකයන් තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය. තව ද, එම අත්සන් තැබීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් තබන අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය.

**19.** සභාවේ සහ ආයතනයේ සියලු නිලධරයන් හා සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ, සාමාජිකයන්, සියලු නිලධරයන් හා සේවානියුක්තයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**20.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

ආයතනය (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**21.** මේ පනත යටතේ තමාගේ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය හෝ යම් නීතියක් යටතේ එසේ කිරීමට අධිකරණයක් මගින් අවශ්‍ය කරනු ලබන අවස්ථාවක හෝ හැර, සභාවේ කිසිම සාමාජිකයකු හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් මේ පනත යටතේ තමාගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී තමන් විසින් ලබාගත් යම් තොරතුරක් යම් තැනැත්තකුට හෙළිදරව් නොකළ යුතු ය.

තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව.

**22.** මෙම පනත යටතේ හෝ සභාවේ විධානයක් අනුව හෝ සිදු කරන ලද ක්‍රියාවක් පිළිබඳව යම් තැනැත්තකුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී යම් තැනැත්කු විසින් දරන ලද වියදම්, අධිකරණය විසින් එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියාවක් බව අදහස් කරන්නේ නම් එම වියදම ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

යම් තැනැත්තකු දරන ලද වියදම ආයතනය මගින් ගෙවිය යුතු බව.

**23.** ආයතනයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක දී සභාවේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රීට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

රීට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

වැරදි සහ දණ්ඩන.

**24.** මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට වූ ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී සිරදඬුවමකට හෝ රුපියල් පන්සියයට නොවැඩි දඩයකට හෝ එකී සිරදඬුවම හා දඩය සහ දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.